# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2315/59 – 2023 ජනවාරි මස 20 වැනි සිකුරාදා – 2023.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල වන මම, එකී මණ්ඩලයට අළුත්ගම, මතුගම අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ කොලේමෝදර තුළුමුව සඳහා පවරාගෙන ඇති ඉඩම් කොටසට අතිරේකව ඉඩම් ප්‍රමාණයක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/02/KT/521.
2023 ජනවාරි මස 11 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

කළුතර දිස්ත්‍රික්කයේ, මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 815B, පහලගොඩ ග්‍රාම නිලධාරි වසමේ, පහලගොඩ ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු එච්. ආර්. එම්. නිසංසලා විසින් 2021.09.05 දිනෙන් අඳින ලද අංක 008 දරන සැලැස්මේ කැබලි අක්ෂර A, B ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01 යි පර්චස් 27.38 ක පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස්:

**කැබලි අක්ෂර A**

*උතුරට* : ගමගේ පියසේන හිමිකම් කියන කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය ඉඩම සහ කළු ගඟ;
*නැගෙනහිරට* : රජයේ ඉඩම සහ පාර;
*දකුණට* : ගමගේ පියසේන හිමිකම් කියන කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය ඉඩම සහ පාර;
*බටහිරට* : ගමගේ පියසේන හිමිකම් කියන කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය ඉඩම.

**කැබලි අක්ෂර B**

*උතුරට* : රජයේ ඉඩම;
*නැගෙනහිරට* : ගමගේ පියසේන හිමිකම් කියන කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය ඉඩම සහ පාර;
*දකුණට* : ගමගේ පියසේන හිමිකම් කියන කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය ඉඩම සහ පාර;
*බටහිරට* : රජයේ ඉඩම සහ පාර.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය* :

**කැබලි අක්ෂර A සහ B** - ගමගේ පියසේන සහ වෙනත් අය.

EOG 01 – 0200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.